කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි / පෙබරවාරි

සමාජීය විද්‍යා පීඨය

භූගෝල විද්‍යාව - GEOG- E 2015

භෞතික භූගෝල විද්‍යා සංකල්ප

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. භෞම ගෝලයෙහි විවිධ ස්වභාවික සංසිද්ධීන්ගේ කාලිකව සිදුවන වෙනස්වීම් අධ්‍යයනය කිරීමෙන් භෞතික භූගෝලවිද්‍යා විෂය ක්ෂේත්‍රය පෝෂණය වී ඇති අන්දම සාකච්ඡා කරන්න.

02. සාගර හා වායුගෝලීය උෂ්ණත්ව වෙනස්වීම් නිවර්තන කලාපීය රටවල දේශගුණික වෙනස්වීම්වලට බලපා ඇති අන්දම පැහැදිලි කරන්න.

03. මහාද්වීප නිර්මානය පැහැදිලි කිරීමේදී මහාද්වීප ප්ලවන කල්පිතය යොදා ගැනීමේ යෝග්‍යතාව අගය කරන්න.

04. මතු සඳහන් මාතෘකාවලින් **<u>දෙකක් (02)</u>** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   1) ගංගා ඛාදන ක්‍රියාවලිය හා ඩේවිසියානු චක්‍රය
   2) නිවර්තන කලාපීය වාසුළි හා ඉහළ වායුගෝලීය තත්ත්වය
   3) භූ තැටි ක්‍රියාකාරිත්වය සහ සුනාමි ඇතිවීම
   4) කඩොලාන පරිසර පද්ධති හා ජෛව විවිධත්වය

05. නිවර්තන තෙත් වනාන්තර හා සෞම්‍ය කලාපීය තෘණභූමි බයෝමයක (ජීව සමුද්‍රයක- Biome) අජීව සාධක හා වෘක්ෂලතා අතර පවතින සම්බන්ධතාව සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

06. වෙරළාශ්‍රිත ප්‍රදේශවල භූරූප නිර්මාණයට බලපාන සාධක තුනක් (03) උදාහරණ හා රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

07. ද්විතීය උත්කර්ෂයක් වශයෙන් සවානා වෘක්ෂලතාවක් ඇතිවීමට මානුෂ කටයුතු බලපා ඇති ආකාරයට පරීක්ෂා කරන්න.

08. "කාන්තාරකරණය හා ලවනීයකරණය අතර වෙනස පෙන්වා දී ලවනීකරණය මගින් භූමිය හායනය වන ආකාරය පැහැදිලි කරන්න.

******************************